සැ. යු. —2014.06.13 දින පළ වූ අංක 1,867 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,868 - 2014 ජුනි මස 20 වැනි සිකුරාදා - 2014.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 790 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 795 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූලි මස 11 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජුනි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අවම සුදුසුකම් හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | මුරකරු III වැනි පන්තිය | 01 | පී.එල්. 1-2006ඒ රු.11,730 - 10 x 120- 10 x 130 - 10 x 145- 12 x 160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |
| 02. | සෞඛ්‍ය කම්කරු III වැනි පන්තිය | 02 | පී. එල්. 1-2006 ඒ රු. 11,730- 10 x 120 - 10x 130-10 x 145- 12 x 160-රු.17,600 | අවම වශයෙන් 08 වන ශ්‍රේණියට (09 වන වසරට) නියමිත විෂයය නිර්දේශය සම්පූර්ණ කර තිබිය යුතු ය. |
| 03. | විදුලි කාර්මික | 01 | පී. එල්. 1-2006ඒ රු. 12,210 - 10 x 130 10 x 145 - 10 x 160 - 12 x 170-රු.18,600 | *(අ)* දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.<br><br>*(ආ)* වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වන මට්ටමේ (NVQ2) හෝ 3 වන මට්ටමේ (NVQ 3 ) සහතිකය ලබා තිබීම ;<br>හෝ<br>*(ඇ)* කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>හෝ<br>(ඈ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>*(ඉ)* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>*(ඊ)* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>*(උ)* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. |
| 04. | රියැදුරු II ආ | 01 | පී. එල්. 3- 2006 ඒ රු.12,470 - 10 x 130- 10 x 145 - 10 x 160- 12 x 170 - රු. 18,860 | *(අ)* අධ්‍යයන පොදු සහතික කළ පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරක දී සමත්වී තිබිය යුතු ය.<br><br>*(ආ)* මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ බලපත්‍රයක් ලබා තිබීම. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | *(ඈ)* පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව සහතිකයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සී හා සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)<br>හා<br>තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)<br><br>(ඇ) රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් රියදුරකු ලෙස වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතු ය.<br><br>(ඉ) දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>(ඊ) අවම වශයෙන් උස අඩි 05යි අඟල් 2 1/2 ක් විය යුතු අතර මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීම සඳහා වූ පොදු කොන්දේසි :*

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරුවන් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අඛණ්ඩව වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවන් කරනු ලැබුවකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබුවෙකු නොවිය යුතු ය.
6. දැනටමත් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික හෝ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කෙරේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.
2. රියැදුරු තනතුරට බඳවා ගැනීමට පෙර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ වෘත්තීය පරීක්ෂණයේ ප්‍රතිඵල මත අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

   ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුනත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතයි.
2. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.
4. ප්‍රමාණවත් ඇපයක් මුදලින් හෝ නියම කරනු ලබන වෙනත් ආකාරයකින් ගෙවන ලෙසට නියම කළහොත් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු ය.
5. මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූල ව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටී.
6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2014.07.07 වැනි දිනට හෝ එදිනට පෙර ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව, කුරුදුවත්ත කඩ වීදිය, යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුවේ. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුවේ.) අයදුම්පත් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන :*

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතු වේ:–

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
4. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතු ය.),
5. සේවා සහතිකය, (දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි)

දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතු ය.

ඩී. ඒ. රංජනී ප්‍රේමලතා,
ලේකම්,
ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 04 වැනි දින,
ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව***

*................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. *(අ)* මුලකුරු සමග නම :————————,
*(ආ)* සම්පූර්ණ නම :————————,
2. ලිපිනය :————————,
3. උපන් දිනය : අවුරුද්ද :————————, මාසය :————————, දිනය :————————,
1. 2014.07.07 වැනි දිනට වයස :————————,
4. ස්ත්‍රී/පුරුෂ භාවය :————————,
5. විවාහක/අවිවාහක බව :————————,
6. ජාතිය :————————,
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :————————,
8. අධ්‍යාපන සුදුසුකම් :————————,
9. වෘත්තීය සුදුසුකම හා පළපුරුද්ද :————————,
10. රියැදුරු තනතුරු සඳහා වන්නේ නම් :————————,
*(අ)* රියැදුරු බලපත්‍රයේ අංකය :————————,
*(ආ)* නිකුත් කළ දිය :————————,
10. ඔබ දැනටමත් මෙම ආයතනයේ සේවය කරන්නේ නම් තනතුර හා සේවා කාලය :————————,

(එම පත්වීමේ ස්වභාවය : ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග):

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————,

06-658

## පානදුර ප්‍රාදේශීය සභාව

පානදුර ප්‍රාදේශීය සභාවේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:-

| *අනු. අංකය* | *තනතුර හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 01. | කාර්යාල කාර්ය සහයක 03<br>III ශ්‍රේණිය<br>මාසික රු. 11,730- 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - රු.17,600,<br>(12 පියවර ආරම්භක වැටුප් ( 11 පන්තියේ කඩඉම් පියවර 13,840 කි) | 8 ශ්‍රේණිය (09 වසර) සමත් විය යුතුය. |
| 02. | ක්ෂේත්‍ර කම්කරු 04<br>III ශ්‍රේණිය<br>මාසික රු. 11,730- 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - රු.17,600,<br>(4 වැටුප් පියවර රු.12,090 පෙර කඩඉම) | 5 ශ්‍රේණිය (6 වසර) සමත් විය යුතුය. |
| 03. | සෞඛ්‍ය කම්කරු 05<br>III ශ්‍රේණිය<br>මාසික රු. 11,730- 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - රු.17,600,<br>(4 වැටුප් පියවර 12,090 පෙර කඩඉම) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

(iii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 03ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචියක් තිබිය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.)

(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

(vi) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයකු විය යුතුය.

(vii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.

(viii) පානදුර ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

(ix) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේදී, බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවාගැනීමේ පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවාගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම, පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ. දැනටමත් ස්ථිර සේවකයින් අවුරුදු 01ක පරිවාස කාලයකට යටත්වේ.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

(iv) මෙම බඳවා ගැනීම් කොන්දේසි හි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද/රජයේ මුදල් රෙගුලාසි වලටද/ රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ පානදුර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. *සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය :*

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
(v) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබාගත් එකක් විය යුතු ය),
(vi) පළපුරුද්ද පිළිබඳ සහතික,
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

05. වෘත්තීය තොරතුරු සමග සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පතක් අදාළ සියලුම සහතිකවල පිටපත් ද සමඟින් 2014.07.11 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

06. ආදර්ශ අයදුම්පත පුරවා ලියාපදිංචි තැපෑලෙන් “ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව” යන ලිපිනයට යොමු කරන්න.

07. දැනට සේවයේ යෙදී සිටින අය ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ලබාගෙන අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**.................................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. සම්පූර්ණ නම :———————
2. ලිපිනය :———————
3. උපන් දිනය :———————
4. වයස :———————
5. විවාහක/අවිවාහක බව :———————
6. ආගම :———————
7. ජාතික හැඳුනුම්පත් අංකය:———————
8. ඉගෙනුම ලැබූ පාසැල :———————
9. අධ්‍යාපන සුදුසුකම් :———————
10. වෘත්තීය සුදුසුකම් :———————

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි ඒවා වන අතර වැරදි හෝ අසත්‍ය තොරතුරක් සැපයුවහොත් මා එම තනතුරට නුසුදුසු අයෙකු වන බව ද මෙයින් සහතික කරමි.

———————
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————

06-593

# පළාත් පාලන නිවේදන

## වරකාපොල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) සහ 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2012.06.26 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී ගන්නා ලද, අංක 08-04 දරන තීරණය අනුව මෙහි පහත දක්වා ඇති සහ එකී උපලේඛනවල විස්තර වන පාරවල් වරකාපොල ප්‍රාදේශීය සභාව සතු පාරවල් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබීමට සුදුසු බව තීරණය කරනු ලැබිය.

ඒ අනුව පහත උපලේඛනවල සඳහන් පාරවල් නාමලේඛනය වරකාපොල ප්‍රාදේශීය සභාව සතු පාරවල් බවට ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාර සබරගමු පළාත් සභාවේ ගරු පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතිය ලබාගෙන ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් හෝ මෙම පාරට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවය විසින් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තුන් මසක් (03) ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 24(2) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙහි සඳහන් හා එකී උපලේඛනවල විස්තර වන පාරවල් වරකාපොල ප්‍රාදේශීය සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කීර්තිසිරි විජේතුංග,
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

01. ග්‍රා. නි. වසම :- 92 ඊ, ගණිතපුර — ගම :- මැදගොඩ
පාරේ නම :- කේ. පී. මානෙල්වත්ත — පළල :- මීටර් 2.43
පාරේ දිග :- මීටර් 153.35
ආරම්භක ස්ථානය :- වරකාපොල සිට පාරේ ගණිතපුර හන්දියට යන ප්‍රාදේශීය සභා පාර කඳන්ගමුවැවත්ත ඇඳහේන ඉඩමේ අවසන් මායිම
පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| කේ. ආර්. ගුණපාල - කඳන්ගමුවැවත්ත | සුනිල් ජයන්ත සිරි - බණ්ඩාරවත්ත |
| කේ. ජී. චමිල - කඳන්ගමුවැවත්ත | අශෝක ප්‍රේමරත්න - උක්කුගේ වත්ත නොහොත් පංගුකාරයාගේ වත්ත නැකතිගේ වත්ත |
| පොඩිහාමිනේ - කඳන්ගමුවැවත්ත | |
| ආයුපාල ඒකනායක - කඳන්ගමුවැවත්ත | |
| සුනිල් ශාන්ත - හිටිනාවත්ත | |
| එන්. ජී. විජේරත්න - ඇඳහේන | |
| කේ. ජී. පොඩිබණ්ඩා - ඇඳහේන | |

02. ග්‍රා. නි. වසම :- 93 ඊ, හල්ලව — ගම :- හල්ලව
පාරේ නම :- හල්ලව උඩාතුපිටිය සිට හල්ලව ජනපදයට යන පාර — පාරේ දිග :- මීටර් 500
පාරේ පළල :- මීටර් 3
ආරම්භක ස්ථානය :- වරකාපොල අඟුරුවැල්ල පාරේ හල්ලව උඩාතුපිටිය කඩය අසලින්
පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| එම්. කේ. සුමනාවතී - උඩාතුපිටියවත්ත | එම්. කේ. සුමනාවතී - උඩාතුපිටියවත්ත |
| ඩබ්. ඒ. රංජනී වීරක්කොඩි - හිටිනාවත්ත | ඩබ්. ඒ. රංජනී වීරක්කොඩි - හිටිනාවත්ත |
| ආර්. පී. තුෂාර සම්පත් - හිටිනාවත්ත | ආර්. පී. තුෂාර සම්පත් - හිටිනාවත්ත |
| ජේ. එම්. හේමවතී මැණිකේ - හිටිනාවත්ත | ජේ. එම්. හේමවතී මැණිකේ - හිටිනාවත්ත |
| ඩබ්. ඒ. එස්. එල්. වීරක්කොඩි - හිටිනාවත්ත | ජේ. එම්. හේමවතී මැණිකේ - හිටිනාවත්ත |
| ඩබ්. ඒ. එස්. එල්. වීරක්කොඩි - අස්සැද්දුම කුඹුර | ජේ. එම්. හේමවතී මැණිකේ - අස්සැද්දුම කුඹුර |
| ඩී. ටී. හේමරත්න - පරණවත්ත | ඩී. ටී. හේමරත්න - පරණවත්ත |
| ඩබ්. සරනේරිස් - ජනපද කොටස | එච්. ඒ. පොඩිමැණිකේ - ජනපද කොටස |

03. ග්‍රා. නි. වසම :- 87 සී කිණිවිට ගම :- කිණිවිට
පාරේ නම :- බකමූණ දොරෝව පාර පළල :- මීටර් 02.44
පාරේ දිග :- මීටර් 1,000
ආරම්භක ස්ථානය :- ශ්‍රමදාන මාවතේ සිට
පාරේ මායිම :-

| වම් පැත්ත | දකුණු පැත්ත |
|---|---|
| එම් සිසිර කුමාර - තලගහවත්තවෙල | එම්. සිසිර කුමාර - තලගහවත්තවෙල |
| එම්. දීපා - තැන්නේහේන | එම්. උපුල් ඥාණකීර්ති - ගොඩඉඩම, තලගහවත්ත |
| එච්. කරුණාදේව - තැන්නේහේන | එම්. වීරසූරිය - තලගහවත්ත |
| කරුණාරත්න - තැන්නේහේන | පී. එම්. කපිල දිසානායක - ඉහළවත්ත |
| | පී. එම්. බබානිස් - ඉහළවත්ත |
| | එම්. පියසේන - බකමූණ දොරොව්ව |
| | පී. එම්. සෝමරත්න - බකමූණ දොරොව්ව |
| | එම්. උපුල් - තැන්නේහේන |
| | එම්. උපුල් - තැන්නේහේන |
| | කරුණාරත්න - තැන්නේහේන |

04. ග්‍රා. නි. වසම :- අංක 92, කුකුල්පනේ
පාරේ නම :- කම්බිලිපිටිවත්ත පාර පාරේ දිග :- මීටර් 192
පාරේ පළල :- මීටර් 2.43
ආරම්භක ස්ථානය :- දම්මුල්ල හරහා කොහොඹදෙණිය ප්‍රධාන පාරේ දම්මිල්ල දකුණට හැරෙන ස්ථානය
පාරේ මායිම :-

| වම් පැත්ත | දකුණු පැත්ත |
|---|---|
| ඩී. සෝමපාල - කපුවාඋල්ලේහේන | බී. ටී. අමිල අබේරත්න - කුඹුර තැන්නපිටහේන හෙවත් හිටිනාවත්ත |
| ඩී. පුෂ්ප කාන්ති - තේපැලවත්තහේන | ඩී. විල්බට් පෙරේරා - කුඹුර තැන්නපිටහේන හෙවත් හිටිනාවත්ත |
| ඩී. සෝමපාල - ළිඳවත්තහේන | ඩී. සොපියා - කුඹුර තැන්නපිටහේන හෙවත් හිටිනාවත්ත |
| ඩී. සෝමපාල - කපුවාඋල්ලේහේන | ඩී. උපාලි - කුඹුර තැන්නපිටහේන හෙවත් හිටිනාවත්ත |

06-559/1

---

**වරකාපොල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) සහ 24(2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ කැගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2012.10.30 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී ගන්නා ලද අංක 12-01 දරන තීරණය අනුව මෙහි පහත දක්වා ඇති සහ එකී උපලේඛන වල විස්තර වන පාරවල් වරකපොල ප්‍රාදේශීය සභාව සතු පාරවල් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබීමට සුදුසු බව තීරණය කරනු ලැබිය.

ඒ අනුව පහත උපලේඛන වල සඳහන් මාර්ග නාමලේඛනය වරකාපොල ප්‍රාදේශීය සභාව සතු මාර්ග බවට ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය ප්‍රකාර සබරගමු පළාත් සභාවේ ගරු පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතිය ලබාගෙන ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව විසින් හෝ මෙම මාර්ග වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වය විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට තුන් මසක් (03) ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 24(2) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි සඳහන් හා එකී උපලේඛනවල විස්තර වන පාරවල් වරකාපොල ප්‍ර ාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කීර්තිසිරි විජේතුංග,
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

01. ග්‍රා. නි. වසම :- 97 උඩුවක — ගම :- පරනාතල
පාරේ නම :- වැරැල්ල හේන පාර — පාරේ පළල :- මීටර් 4.2
පාරේ දිග :- මීටර් 250
ආරම්භක ස්ථානය :- අල්ගම සිට ගලපිටමඩ මාර්ගයේ මංසන්ධිය අසලින්
පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| ලලිත් රණතුංග - එපියඹිවිටේ වත්ත | එච්. ඒ. චන්ද්‍රසේන - එපිටඹිවිටේ වත්ත |
| එච්. ඒ. අනුෂා සංජීවනී - වැරැල්ලහේන | එච්. ඒ. සමන් ප්‍රදීප් කුමාර - වැරැල්ලහේන |
| එච්. ඒ. කල්‍යාණි - වැරැල්ලහේන | එච්. ඒ කල්‍යාණි - වැරැල්ලහේන |
| එච්. ඒ. බෙලින්සිංඤෝ - වැරැල්ලහේන | එච්. ඒ. බෙලින්සිංඤෝ - වැරැල්ලහේන |

02. ග්‍රා. නි. වසම :- 94 බී, නිවටුව — ගම :- පහල වැලිගල්ල කොස්නාවල
පාරේ නම :- මකුලුගහයට මාර්ගය — පාරේ පළල :- මීටර් 4.2
පාරේ දිග :- මීටර් 128
ආරම්භක ස්ථානය :- පහල වැලිගල්ල කොස්නාවල මාර්ගයෙහි මකුලුගහයට හරස් මාර්ගය
පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| ඩබ්. සෝමරත්න - වහකුලහේන කුඹුර | කේ. ඒ. පියදාස - දඹුගොල්ලකුඹුර |
| පී, එච්. මල්ලිකා රෝහිණී - වහකුලහේන කුඹුර | පී. එච්. ආනන්ද පියසේන - දඹුගොල්ල කුඹුර |
| බී. ජී. ධර්මපාල - වහකුලහේන කුඹුර | පී. එච්. අතුල දයාරත්න - දඹුගොල්ල ඉඩම |
| පී. ජී. පියදාස - වහකුලහෙන් කුඹුර | |
| බී. එච්. ගුණදාස - මකුලුගහයට කුඹුර | |
| බී. ජී. සමන් කරුණාසේන - මකුලුගහයට කුඹුර | |
| කේ. ඒ. පියදාස - මකුලුගහයට කුඹුර | |

03. ග්‍රා. නි. වසම :- 79ඒ, කලුගල — ගම :- ඉහල කලුගල
පාරේ නම :- නාරංගහහේන මාර්ගය — පාරේ පළල :- මීටර් 3.36
පාරේ දිග :- මීටර් 400
ආරම්භක ස්ථානය :- කලුගල කරපනේ මාර්ගයෙන් බීඩි කාමරය ඉඩමේ සනත් දමිතගේ නිවස අසලින්
පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| කලුගල සෝරත හිමි - පරනවත්ත නොහොත් හිටිනාවත්ත | රංජිත් සෝමරත්න - පරණවත්ත නොහොත් හිටිනාවත්ත |
| ආර්. පී. සී. උදය කුමාර - නාරංගහහේන | ආර්. පී. සී. උදය කුමාර - නාරංගහහේන |
| ආර්. පී. පියසේන - නාරංගහහේන | ආර්. පී. පියසේන - නාරංගහහේන |
| එස්. එම්. සමරසිංහ - නාරංගහහේන | එස්. එම්. සමරසිංහ - නාරංගහහේන |
| ආර්. ඩී. ඤාණසිංහ - නාරංගහහේන | ආර්. ඩී. සුජීවා ගුණතිලක - නාරංගහහේන |
| ආර්. ඩී. චින්තක ගුණසිංහ - නාරංගහහේන | ඩබ්. ඩී. ප්‍රේමාවතී - නාරංගහහේන |
| | ආර්. ඒ. කේ. දීප්තිකා රණසිංහ - නාරංගහහේන |

04. ග්‍රා. නි. වසම :- තුඹලියද්ද — ගම :- තුඹලියැද්ද
පාරේ නම :- කොස්ගහහේන — පාරේ පළල :- මීටර් 2.10
පාරේ දිග :- මීටර් 145
ආරම්භක ස්ථානය :- තුඹලියැද්ද හන්දියේ සිට හපුගල්ගොඩ වත්ත දක්වා යන මාර්ගයේ ඇල ලඟ සිට
පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| ඩබ්. නන්දාවතී - කන්දේඅරඹ, ළිඳමුලහේන | ඩබ්. නන්දාවතී කන්දේඅරඹ, ළිඳමුලහේන |
| ඩබ්. ඩේලින් ගුණසීලි හල්ගහමුලහේන | ඩබ්. ඩේලින් ගුණසීලි හල්ගහමුලහේන |

05. ග්‍රා. නි. වසම :- 90ඒ, පහලලෙනගල — ගම :- පහල ලෙනගල

පාරේ නම :- පුරණ පාර — පාරේ පළල :- මීටර් 3.36

පාරේ දිග :- මීටර් 150

ආරම්භක ස්ථානය :- පහල ලෙනගල ප්‍රාදේශීය සභා මාර්ගය අසලින්.

පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| ජී. මහින්දපාල, දන්ගොල්ල කුඹුර. | |
| ඩබ්. විජේරත්න සහ තවත් අය දන්ගොල්ල කුඹුර | |
| එස්. එච්. සිමන්දිරිස්, එස්. එච්. දියෝනිස් සහ තවත් අය., දංගොල්ල කුඹුර. | දකුණු පසින් ඇල මාර්ගය පිහිටා ඇත. |
| ඕ. ගුණපාල සහ තවත් අය, දංගොල්ල කුඹුර | |

06. ග්‍රා. නි. වසම :- මැණික්කඩවර — ගම :- මැණික්කඩවර

පළල :- මීටර් 3. 7

පාරේ දිග :- මීටර් 200

පාරේ නම :- මැණික්කඩවර පාලම අසල සිට ගෝනවවත්ත උඩහගෙදර ගල්ඒදණ්ඩ මාර්ගය

ආරම්භක ස්ථානය :- පාලම අසලින්

පාරේ මායිම :-

| *වම් පැත්ත* | *දකුණු පැත්ත* |
|---|---|
| ආර්. එම්. හේමචන්ද්‍ර රත්නායක, ලියන්ගහකුඹුර | වයි. කේ. මුදියන්සේ, දෙහිගහමුලලියැද්ද |
| ජී. ආර්. තිලකරත්න, රේණුකාව | වයි. කේ. හේමලතා, දෙහිගහමුලකුඹුර |
| මල්ලිකා රත්නායක, ඔලියකුඹුර | පියසීලි මල්ලිකා, දෙහිගහමුල කුඹුර |
| ටී. ඒ. සිසිරකුමාර. ඔලියකුඹුර | ජී. ආර්. ශාන්තකුමාර, කෙතේඕවිට කුඹුර |
| ආර්. එම්. වික්‍රම රත්නායක, ලියන්ගහකුඹුර | එම්. ආර්. තිලකරත්න, කෙතේඕවිට කුඹුර |
| වයි. කේ. මැණිකේ, යටියන්කුඹුර | මැණිකේ යටියන්කුඹුර, ඔලියකුඹුර. |
| වයි. කේ. එස්. හේරත්, රේණුකාව | හැරියට් ශාන්තිකුමාරි, කෙතේඕවිට කුඹුර |
| එච්. එල්. විරාජ් අසංක ලියනගේ, රේනුකාව | |
| පී. ආර්. පොඩිමැණිකේ, රේණුකාව | |
| යූ. කේ. පොඩිබණ්ඩා, දෙහිගහමුලලියැද්ද. | |

06-559/2

---

## බිංගිරිය ප්‍රාදේශීය සභාව - බිංගිරිය

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් හීන්පන්නාව ග්‍රාමයේ ඇති මැද මාර්ගය "ආනන්ද අබේසිංහ මාවත" ලෙස නම් කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2013.10.31 දින පැවති මාසික සභාවේ රැස්වීමේ අංක 04-1 දරන යෝජනාව පරිදි වයඹ පළාත් පාලන විෂයය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් 2014.04.30 වැනි දින සිට ඉහත සඳහන් මාර්ගය ආනන්ද අබේසිංහ මාවත යනුවෙන් නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. දිමුත් තුෂාර ඒකනායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

2013 මැයි මස 13 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලය,
බිංගිරිය.

06-510

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.